# 1.38 නාසරතයේ ජේසුතුමන්ගේ උපත හා බැඳි සුභාරංචි කථා පුවත (Infancy Narrative) පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

පී. විජිත් රොහාන් ප්‍රනාන්දු
බටහිර සම්භාව්‍ය සංස්කෘති හා ක්‍රිස්තියානි සංස්කෘත අධ්‍යයනාංශය

## ABSTRACT

නාසරතයේ ජේසුතුමන්ගේ උපත සමරන නත්තල් මංගල්‍යය මුළු මහත් ක්‍රිස්තියානි ජනතාවට පොදු ආගමික උත්සවයකි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ජේසු උපත සඳහන් සුභාරංචි කථා පුවත පිළිබඳ විමර්ශනාත්මක බයිබලීය අධ්‍යයනයක නියැලීම ය.

පූර්වෝක්ත අධ්‍යයනයට අදාළ පර්යේෂණ ගැටලු දෙකකි.

ජේසුතුමන්ගේ ධර්මය අඩංගු නව ගිවිසුමේ මුළු පොත් ගණන 27ක් වුව ද ජේසු උපත පිළිබඳ සඳහන් වී තිබෙන්නේ මතෙව් හා ලූක් යන සුභාරංචි ග්‍රන්ථවල පමණි. (මතෙව් 1/1-25, 2/1-23, ලූක් 2/1-52).

මේ හේතු කොට ගෙන නව ගිවිසුමේ ගත්කතුවරුන් ජේසු උපත පිළිබඳ කථා පුවතට අවම අවධානයක් යොමු කළේ මන්ද යන්න ඉන් පළමු ගැටලුවයි.

දෙවන ගැටලුව වන්නේ මතෙව් හා ලූක් සුභාරංචි කතුවරුන් දෙදෙනා ම ජේසුතුමන්ගේ උපත සිදු වූයේ ජුදයේ බෙත්ලෙහෙමේ බව සඳහන් කොට තිබුණ ද ජේසු උපත පිළිබඳ ප්‍රධාන සිද්ධීන් සතරක් සටහන් කිරීමේ දී එකිනෙකට වෙනස් වූ කරුණු දක්වා ඇත්තේ මන්ද යන්නයි.

1. ලූක් සුභාරංචියට අනුව ජේසුතුමන්ගේ දෙමාපියන් වූ ජෝසප් හා මරියාට නාසරත් ගමෙන් නික්ම ජුදයේ බෙත්ලෙහෙම බලා යාමට සිදු වුයේ සංගණනයක් සඳහා අගොස්තුස් අධිරාජයා වෙතින් පැමිණි නියෝගයක් හේතු කොට ගෙන ය. එහෙත් ජේසු උපත හා සම්බන්ධ වූ සංගණනයක් පිළිබඳ පුවත මතෙව් සුභාරංචියේ සඳහන් වන්නේ නොමැත.

2. ලූක් සුභාරංචියට අනුව ජේසු උපත දේවදූතයෙක් මාර්ගයෙන් පළමුව දැනගන්නේ ජුදා එඬේරුන් ය. එහෙත් මතෙව් සුභාරංචියට අනුව ජේසු උපත පළමුව ප්‍රකාශ වන්නේ තාරකාවක් මගින් පෙරදිගින් පැමිණි අන්‍ය ජාතික ශාස්ත්‍රවන්තයින්ට ය.

3. ශාස්ත්‍රවන්තයින් තිදෙනා ජෙරුසලමට ගොස් හෙරොද් රජ හමු වීමේ ප්‍රතිඵලයක් ලෙස ළදරු ඝාතනය නම් වූ සිද්ධියක් මතෙව් සුභාරංචියේ සඳහන් ව තිබෙන අතර හෙරොද්ගේ මරණීය තර්ජන හමුවේ ජෝසප් හා මරියා බිළිඳු ජේසුව රැගෙන මිසරයට පලා යයි. එහෙත් ලූක් සුභාරංචියට අනුව ජේසු උපත ඉතාමත් සාමකාමී වාතාවරණයක සිදු වන අතර ජෝසප් හා මරියා ළදරු ජේසුස් ව ජෙරුසලමේ දේව මාළිගාවේ දී කැප කොට නැවතත් නාසරතයට පැමිණි බව සඳහන් ව තිබීම.

4. ලූක් සුභාරංචියට අනුව ජෝසප් හා මරියා ගලීලයේ නාසරතයේ සිට බෙත්ලෙහෙම වෙත පැමිණි විට ජේසු උපත ගව මඩුවක සිදු වුව ද මතෙව් සුභාරංචියට අනුව ජෝසප් හා මරියාගේ නිවස පිහිටා තිබෙන්නේ බෙත්ලෙහෙමේ වන අතර ජේසු බිළිඳු උපදින්නේ ද එම නිවසේ වීම.

නාසරතයේ ජේසුතුමන්ගේ උපතේ සිට විපත දක්වා වූ ජීවිත කථාවක් සුභාරංචි ග්‍රන්ථවල හෝ නව ගිවිසුමේ අනෙකුත් ග්‍රන්ථවල හෝ සටහන් නොවූ බව විග්‍රහ කරන දේවධාර්මික මතයට අනුව පළමු පර්යේෂණ ගැටලුව සාධනය කළ හැකිය.

සුභාරංචි කතුවරුන් තමන්ගේ සංසයන්ට ආවේණික වූ මගක් ඔස්සේ යමින් ජේසු උපත අර්ථකථනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මතෙව් හා ලූක් යන සුභාරංචිවල ජේසු උපත පිළිබඳ එකිනෙකට වෙනස් සිද්ධීන් සටහන් ව තිබෙන්නේය යන දේවධාර්මික විග්‍රයෙන් දෙවන පර්යේෂණ ගැටලුව සාධනය කළ හැකි ය.